**කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව**
**නීති පීඨය**

**නීතිවේදී උපාධි පරීක්ෂණය - තෙවන වසර - 2020/21 (මාර්ගගත)**

# සාගර නීතිය

**පැය තුනයි (3)**

**මුළු ප්‍රශ්න සංඛ්‍යාව: 06**

**ප්‍රශ්න <u>තුනකට</u> (3) පමණක් පිළිතුරු සපයන්න**

**(අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ)**

---

1. 1982 සාගර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCLOS) මඟින් සාගර නීතිය පිළිබඳ ජාත්‍යන්තර ආරවුල් විසඳීම සඳහා නව සංසද හඳුන්වා දී ඇත. මෙය නීතියේ වර්ධනයට සහ ජාත්‍යන්තර සාමය පවත්වා ගැනීමට ධනාත්මක දායකත්වයක් යැයි බොහෝ දෙනෙක් ප්‍රකාශ කරයි. කෙසේ වෙතත්, ආරවුල් සමථයකට පත්කිරීමේ ආයතන සංඛ්‍යාව වැඩි වීමෙන්, හරයාත්මක කරුණු සහ කාර්යපටිපාටිය යන දෙකෙහිම ඛණ්ඩනීකරණයට (fragmentation) හේතු වන බවත්, එය සමස්තයක් ලෙස ජාත්‍යන්තර නීතියේ ඒකත්වය (unity) විනාශ කළ හැකි බවත්, සමහර නීති විශාරදයින් අනතුරු අඟවයි.

UNCLOS හි කාර්යභාරය, එහි ආරවුල් විසඳීමේ ක්‍රියාවලිය සහ සාගර නීතියේ විනිශ්චිත නඩු ආශ්‍රයෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 100)

2. අඩානා රාජ්‍යයේ යනු උත්තර ධ්‍රැව ප්‍රදේශයේ පිහිටා ඇති විශාල වෙරළබඩ රාජ්‍යයක් වන අතර, එයට කුඩා වෙරළබඩ දූපත් බොහොමයක් ඇතුළත් වේ. මෑතක් වන තුරුම, අඩානාහි කුඩා දූපත්, විශාල බොකු සහ යාබද මුහුදු

ප්‍රදේශයෙන් සැලකිය යුතු කොටසක්, නිත්‍යයෙන්ම අයිස්වලින් වැසී තිබුණි. කෙසේ වෙතත්, අඩානා රාජ්‍යයේ ගොඩබිම් සහ මුහුදු අයිස් දියවීම වැඩිවීමත් සමඟ, අඩානාහි වෙරළබඩ ප්‍රදේශ පැහැදිළිව, දෘශ්‍යමාන ලෙස, වෙනස් වී ඇති අතර, වර්තමාන සිතියම් නැවත ඇඳීමට සහ පවතින සමුද්‍ර කලාප නීති සහ රෙගුලාසි අවලංගු කිරීමට රජය තීරණය කර ඇත. ප්‍රවෘත්ති වාර්තා වලට අනුව අඩානා රජය විසින් ඍජු පාද රේඛා (straight baselines) භාවිතා කරමින් ආකිපෙලාගික (archipelagic) රාජ්‍යයක් ලෙස ප්‍රකාශ කිරීමට බලපොරොත්තු වන අතර, සියලුම බොකු අභ්‍යන්තර ජලය ලෙස ඇතුළත් වනු ඇති බව පෙනේ. අනෙකුත් රාජ්‍යයන් එම සිදුවිය හැකි වෙනස්කම් ගැන සැලකිලිමත්ව බලා සිටී. අඩානා විසින් 1982 සාගර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCLOS) අනුමත කර ඇත. නමුත් වෙරළබඩ පරිවර්තනයන්හි නැගී එන අභියෝග සමඟ කටයුතු කිරීමේදී සම්මුතිය යල් පැන ගිය බවත්, සමකාලීන අවශ්‍යතාවයට අනුව ක්‍රියා කළ යුතු බවත් අඩානා රජය ප්‍රකාශ කරයි. .

1982 UNCLOS හි වගන්ති සහ අදාළ උදාහරණ වෙත අවදානය යොමු කරමින් ඉහත තත්ත්වය සාකච්ඡා කරන්න.

(ලකුණු 100)

3. ටෝබ්ලෙරෝන් සහ ඕරියො රාජ්‍යයන් දෙකම කැඩ්බෙරි සාගරයේ පිහිටි වෙරළබඩ රාජ්‍යයන් වේ. ටෝබ්ලෙරෝන්හි ආරක්ෂක අමාත්‍යවරයා විසින් දක්වා ඇති කොන්දේසි වලට යටත්ව සහ පූර්ව අවසරයකින් තොරව කිසිදු විදේශීය යුධ නෞකාවක් එහි දේශීය ජල තීරයට ඇතුළුවීම හෝ ඒ හරහා ගමන් කිරීම නොකළ යුතු බවට නීතියක් ටොබ්ලෙරෝන් රාජ්‍යයේ ඇත. ඕරියෝ රාජ්‍යයේ යුධ නෞකාවක් වන ද මාරි නෞකාව ටොබ්ලෙරෝන් රාජ්‍යයේ වෙරළ තීරයේ සිට නාවික සැතපුම් 10 ක් ඇතුළත යාත්‍රා කරමින් සිටියදී ටොබ්ලෙරෝන් රාජ්‍යයේ නාවික හමුදාව විසින් එය නවතා, වහාම එම ප්‍රදේශයෙන් ඉවත් වන ලෙස නියෝග කර ඇත. ද මාරි නෞකාව ටෝබ්ලෙරෝන් වෙරළ තීරයේ සිට නාවික සැතපුම් 20ක් ඈතට ගමන් කළ අතර, එහිදී එම ප්‍රදේශයේ දත්ත රැස් කිරීම සඳහා කුඩා සබ්මැරීන කිහිපයක් දියත් කරන ලදී. ඔරියෝ කියා සිටින්නේ මෙය කැඩ්බරි සාගරයේ මත්ද්‍රව්‍ය ජාවාරම වැළැක්වීම සඳහා කලාපීය

සහයෝගීතාවය සඳහා බවයි. නමුත් ඔරියෝ ඔවුන්ගේ අධිකරණ බලය උල්ලංඝනය කරන බව ටොබ්ලෙරෝන් ප්‍රකාශ කර ද මාරි නෞකාව අත්අඩංගුවට ගත්තේය.

ඉහත තත්ත්වය තුළ රාජ්‍යයන්ගේ අයිතිවාසිකම්, වගකීම් සහ යුතුකම් සාකච්ඡා කරන්න. 1982 UNCLOS හි වගන්ති ඔබේ පිළිතුරට අදාල කරාගත යුතුය.

(ලකුණු 100)

4. ''මතු පරම්පරාව සඳහා සාගර ජීව සම්පත් සුරක්ෂිත කිරීම'' යන මැයෙන් ජාත්‍යන්තර තරුණ සමුළුවේ ප්‍රධාන දේශනයක් පැවැත්වීමට තරුණ කථිකයෙකු ලෙස ඔබට ආරාධනා කර ඇත. ඔබට නීතිමය පුහුණුවක් ඇති බැවින් සහ ඔබ ධීවර හා සංචාරක කර්මාන්තය මත දැඩි ලෙස රඳා පවතින ආර්ථිකයක් සහිත කුඩා නිවර්තන වෙරළබඩ රාජ්‍යයක් නියෝජනය කරන බැවින්, දේශීය ජල තීරයෙන් ඔබ්බට ජීව සම්පත් ගවේෂණය, උපයෝජනය, සංරක්ෂණය සහ කළමනාකරණය සඳහා සාගර නීති රාමුවේ වැදගත්කම පිළිබඳ ඉදිරිපත් කිරීමක් සකස් කිරීමට ඔබ තීරණය කර ඇත.

ප්‍රධාන දේශනය ලියන්න.

(ලකුණු 100)

5. ප්‍රින්ගල් රාජ්‍යය යනු නිල් සාගරයේ පිහිටි මෑතකදී යටත්විජිතභාවයෙන් ස්වාධීනත්වය ලැබූ දූපත් රාජ්‍යයකි. ප්‍රින්ගල් වෙරළේ සිට නාවික සැතපුම් 250 ක් සහ නාවික සැතපුම් 500 ක් දුරින් පිහිටි සාගර පතුලෙහි වටිනා ඛනිජ නිධි දෙකක් විද්‍යාත්මක සමීක්ෂණ මගින් මෑතකදී සොයාගෙන ඇත. ජාත්‍යන්තර නීතිය යටතේ ජලයට ඉහළින් ඇති භූමියට පමණක් නොව මුහුදේ ජලයට යටින් ඇති ගොඩබිමට සහ ස්වාභාවික සම්පත්වලට ද හිමිකම් කිව හැකි බව ප්‍රින්ගල් තේරුම් ගෙන ඇත.

ප්‍රින්ගල් රජයේ අධිකරණ අමාත්‍යාංශයට සහ විදේශ කටයුතු අමාත්‍යාංශයට උපදෙස් දීම සඳහා ස්ථාපිත කර ඇති විශේෂඥ නීති උපදේශක කමිටුවකට ඔබව පත් කර ඇත. දේශීය නීති කෙටුම්පත් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ඇතුළුව රජය විසින් ගතයුතු සුදුසු ක්‍රියාමාර්ග නිර්දේශ කරන සංදේශයක් (memorandum) සකස් කිරීම ඔබේ වගකීමක් වී ඇත.

ඔබේ සංදේශය ලියන්න.

(ලකුණු 100)

6. ඔබ සයුරි රාජ්‍යයේ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක් සහ සාගර නීතිය පිළිබඳ විශේෂඥයෙක් යැයි උපකල්පනය කරන්න. පහත සඳහන් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් නව පනත් කෙටුම්පත් දෙකක් සකස් කිරීමට සයුරි රජය තීරණය කර ඇත.

අ) සයුරි රාජ්‍යයේ දිය යට සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම;

ආ) සයුරි මුහුදු තීරයේ විද්‍යාත්මක ගවේෂණය පිළිබඳ නීති රාමුව.

යෝජිත නව පනත් වලට ඇතුළත් විය යුතු කැපී පෙනෙන ලක්ෂණ පිළිබඳව පාර්ශ්වකරුවන් (stakeholders) පිරිසකට කෙටි ඉදිරිපත් කිරීමක් (presentation) කරන ලෙස ඔබෙන් ඉල්ලා ඇත.

ඔබේ පිටපත ලියන්න.

(ලකුණු 100)

******